සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 2025
# Second Term Test - 2025

| 7 ශ්‍රේණිය | නර්තනය | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. උඩරට නර්තන සම්ප්‍රදායේ නමස්කාර සරඹයේ දී දෙවනුව වැඳීම කරනුයේ,
    (1) බුදුන්වහන්සේට ය. (2) ගුරුවර, දෙමාපියන්ට ය.
    (3) දෙවියන්ට ය. (4) පොළාව මහී කාන්තාවන්ට ය.

02. ''තෙයි තිතා තෙයි'' මෙය,
    (1) හතරවන පා සරඹය යි. (2) තුන් වන පා සරඹය යි.
    (3) පස්වන පා සරඹය යි. (4) හයවන පා සරඹය යි.

03. ''ගත්තකු ජිත්තම් - ගජිතකු ජිත්තම් - තරිකිට ජිත් තරිකිට දොම්කිට තා'' මෙය,
    (1) තුන්වන ගොඩ සරඹයේ කස්තිරමයි. (2) හතරවන ගොඩ සරඹයේ කස්තිරමයි.
    (3) දෑල අඩියේ කස්තිරමයි. (4) සිව් අඩියේ කස්තිරමයි.

04. තුරඟා වන්නෙමේ කස්තිරමේ මුල් පද කොටස වන්නේ,
    (1) ''තත් තකට තක රොං'' ...... ය. (2) ''කුද ගජිගත කුද තා'' ....... ය.
    (3) ''තකු තකට ගත දොංත'' ........ ය. (4) ''කුද ගජිත කුද ගජිත'' ...... ය.

05. පහතරට හා සරබරගමු නර්තන සම්ප්‍රදායන්වල ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වන්නේ පිළිවෙලින්,
    (1) ගැටබෙරය හා දවුල යි. (2) යක්බෙරය හා දවුල යි.
    (3) දවුල හා යක්බෙරය යි. (4) ගැටබෙරය හා උඩැක්කිය යි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහත වරහන තුළින් තෝරා හිස් තැන් පුරවන්න.**

06. විකල්ප වාද්‍ය උපකරණයක් ලෙස ............................................................................ නම් කළ හැක.

07. නර්තනයේ මූලික ඉරියව්ව ............................................................................ ලෙස හඳුන්වයි.

08. කුළු නැටුම සඳහා ............................................................................ කවි යොදා ගැනේ.

09. තාලම්පොටෙන් වැයෙන ධ්වනි ගණන ............................................................................ කි.

10. දවුල් කඩිප්පුව සැදීම සඳහා ............................................................................ යන ලී වර්ගය භාවිත කරයි.

(රන් තෙළඹුවේ, මණ්ඩිය, දඬු බෙරය, ඇට්ටේරියා, දෙක)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | විකල්ප වාද්‍ය භාණ්ඩයකි. | ★ දවුල |
| 12. | තාල තැබීම | ★ යතුර |
| 13. | විතතාතත භාණ්ඩයකි | ★ ටින් බෙරය |
| 14. | කුල්ල | ★ ජන කවි |
| 15. | තලමල වරුණ | ★ තාලම්පට |

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණද ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16. නම්‍යතා අභ්‍යාස කිරීම නිසා මනා සෞඛ්‍ය තත්වයෙන් යුතු පුද්ගලයෙකු බිහි වේ. ( )
17. ගසක් ප්‍රතිනිර්මාණය කිරීමට ස්ථිතික චලන යොදා ගනියි. ( )
18. අලංකාර පද නිතර අභ්‍යාස කිරීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය නොවේ. ( )
19. තල මලක් පිපීම ගමට සුබ දසුනකි. ( )
20. ''රන් තැඹිලි ගස් දෙකයි'' මෙය සුළු මැදුම් දෙතිතට අයත් රබන් පදයකි. ( )

(1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කර අදාළ සම්ප්‍රදාය ඊට ඉදිරියෙන් ලියන්න. (ල. 03)
    (ii) දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන ශාන්තිකර්ම 03 නම් කර අදළ සම්ප්‍රදාය ඊට ඉදිරියෙන් ලියන්න. (ල. 03)
    (iii) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් දෙකක් නම් කරන්න. (ල. 02)
    (iv) ඔබ නම්කරන ලද එක් වන්නමකට අයත් කවියක් ලියන්න. (ල. 02)
    මුළු ලකුණු 10

02. දවුල සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය යි.
    (i) දවුල සකස් කිරීමට යොදාගන්නා අමුද්‍රව්‍ය 04 ක් නම් කරන්න. (ල. 02)
    (ii) දවුල භාවිතා කරන අවස්ථා තුනක් නම් කරන්න. (ල. 03)
    (iii) දවුල වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇඳ කොටස් 04 ක් නම් කරන්න. (ල. 05)
    මුළු ලකුණු 10

03. (i) ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය වන කළඑළි මංගල්‍ය අවස්ථා නර්තන සම්ප්‍රදායන් තුන අනුව වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ල. 03)
    (ii) උඩරට නර්තන සම්ප්‍රදායේ කළඑළි මංගල්‍ය අවස්ථාවේ දී සිදු කරනු ලබන චාරිත්‍ර 3 ක් ලියන්න. (ල. 03)
    (iii) නර්තන විෂය ඉගෙනීමේ දී සිසුන් අත්පත්කර ගන්නා සාරධර්ම 02 ක් සඳහන් කරන්න.(ල. 04)
    මුළු ලකුණු 10

04. රාමසාන් යනු මුස්ලිම් බැතිමතුන්ගේ විශේෂිත වූ ආගමික උත්සවයකි.
    (i) එම උත්සවය පැවැත්වීමට මූලික වූ හේතුව කුමක් ද? (ල. 02)
    (ii) උපවාස ශීලය ආරක්ෂා කරන ආකාරය ලියා දක්වන්න. (ල. 04)
    (iii) මෙම උපවාස ශීලය රැකීමෙන් වර්ධනය කරගැනීමට බලාපොරොත්තුවන ගුණාංග මොනවා ද? (ල. 04)
    මුළු ලකුණු 10

05. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    (i) තලමල වරුණ කවි
    (ii) ගැමි නැටුම්
    (iii) විකල්ප වාද්‍ය භාණ්ඩ
    (iv) ගොඩ සරඹ (ල. 5 × 2 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 3 | 06. දඬු බෙරය | 11. ටින් බෙරය | 16. ✓ |
| 02. 3 | 07. මණ්ඩිය | 12. තාලම්පට | 17. ✓ |
| 03. 1 | 08. රන් තෙළඹුවේ | 13. දවුල | 18. ✗ |
| 04. 4 | 09. දෙක | 14. යතුර | 19. ✗ |
| 05. 2 | 10. ඇට්ටේරියා | 15. ජන කවි | 20. ✓ |

(1 x 20 = 20)

## II කොටස

01. (i) ප්‍රධාන වාද්‍ය භාණ්ඩ තුන නම් කිරීම. (ල. 03)
උඩරට - ගැටබෙරය සබරගමු - දවුල
පහතරට - යක්බෙරය / දොවොල් බෙරය / සෝෂක බෙරය (ල. 03)

(ii) උඩරට - කොහොඹා කංකාරිය
පහතරට - දෙවොල් මඩුව
සබරගමු - පහන් මඩුව (ල. 02)

(iii) වන්නම් දෙකක් නම් කිරීම. (ල. 02)

(iv) කවියක් ලිවීම. (ල. 02)

මුළු ලකුණු = 10

02. (i) අමුද්‍රව්‍ය නම් කිරීම
දවුල් කඳ - ඇහැළ / කොහොඹ / මිල්ල / කිතුල්
හම් - හරක් / එළු හම්
කඩිප්පුව - ඇට්ටේරියා ලී (ල. 03)

(ii) අතීතයේ - අණබෙර / මළ බෙර / වද බෙර / රණ බෙර
හේවිසි සඳහා / තේවා වාදන / නර්තන අවස්ථා (ල. 02)

(iii) රූප සටහන ඇඳීම (ල. 01)
නම් කිරීමට (කොටස් 04 ක්) (ල. 04)

මුළු ලකුණු = 10

03. (i) උඩරට - හිස් වෙස් බැඳීම / ශීර්ෂ හරණ පැළඳවීමේ මංගල්‍යය
පහතරට - මඩු බැසීමේ මංගල්‍යය
සබරගමු - ගුරු වරම්දීමේ මංගල්‍යය (ල. 03)

(ii) ජන්ම පත්‍රය බලා නියම කරගත් දිනට තෙමසකට කලින් කිළිවලින් ආරක්ෂා වීම. / දින 7 ක් ආගමික් වතාවත්වල යෙදීම. / හඟල පේ කිරීම. / බෝධි පූජා පැවැත්වීම. / නැකතට හිස්වෙස් තැබීම ආදී ලෙස කරුණු 03 ක් (ල. 03)

(iii) සාරධර්ම දෙකක් නම් කිරීමට. (ල. 04)

මුළු ලකුණු = 10

04. (i) ඉස්ලාම් නීතියට අනුව බැතිමතුන් නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස ශීලය ආරක්ෂා කිරීම. (ල. 02)

(ii) දිනකට පස්වතාවක් දෙවියන් වැඳීම / දිනකට එක් වතාවක් හිරු බැස ගිය පසු ආහාර අනුභව කිරීම. / නැති බැරි අයට ආධාර ලබා දීම. / උපවාසයේ යෙදීම. / හිමිදිරියේ යාඥා කිරීම. (ල. 04)

(iii) සමගිය වර්ධනය වීම. / සහජීවනය / සමානාත්මතාවය / සංවරබව / බෙදා හදාගැනීම / දුෂ්චරිතවලින් මිදීම. (ල. 04)

මුළු ලකුණු = 10

05. මාතෘකාවලට අදාළව කරුණු සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (5 × 2 = 10) මුළු ලකුණු = 10

| | |
|---|---|
| II කොටස ලකුණු | 30 |
| I කොටස ලකුණු | 20 |
| මුළු ලකුණු | 50 |
| ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලකුණු | 50 |
| | 100 |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

7 ශ්‍රේණිය | නර්තනය

නම/ විභාග අංකය:

## ප්‍රායෝගික පරීක්ෂණය

| | |
|---|---|
| 01. ගායනා | |
| (i) කැමති කවියක් ගායනා කරන්න. | (ල. 05) |
| (ii) ගුරුවරයා විසින් නම් කරන ලද ගායනයක් (කුළු, තාලම්, තලමල මගින්) | (ල. 05) |
| | මුළු ලකුණු 10 |
| 02. සරඹ | |
| (i) පා සරඹ 1 - 6 දක්වා හමාර පදය සමඟ නර්තනය | |
| (ii) (ගුරු අභිමතය පරිදි නම් කරන්න.) සරඹය | (ල. 05) |
| හමාර පදය | (ල. 05) |
| | මුළු ලකුණු 10 |
| 03. (i) ගොඩ සරඹ නර්තනය | |
| (ii) 1 - 4 දක්වා ගොඩසරඹ (ගුරු අභිමතය පරිදි) | (ල. 05) |
| අදාළ කස්තිරම නර්තනය කිරීම. | (ල. 05) |
| | මුළු ලකුණු 10 |
| 04. වන්නම් නර්තනය | |
| (i) තුරඟා වන්නමේ බෙර පදය තාලතබා කීම. | (ල. 02) |
| (ii) කවිය තාල තබා කීම. | (ල. 02) |
| (iii) පදයක් නර්තනය කිරීම. | (ල. 03) |
| (iv) කස්තිරම නර්තනය කිරීම. | (ල. 03) |
| | මුළු ලකුණු 10 |
| 05. චරිත නිරූපණය | |
| සත්ව චරිතයක් නිරූපණය කිරීම. | |
| සමනලයා / සිංහයා / අශ්වයා / වඳුරා | (ල. 10) |

මුළු ලකුණු = 50